*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2024 වර්ෂය සඳහා ලියාපදිංචි පශු වෛද්‍යවරුන්ගේ හා වෘත්තිකයන්ගේ නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,378 - 2024 මාර්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2024.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 976 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 980 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 981 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 අප්‍රේල් මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට්* පත්‍රයේ දැන්වීම් 2024 අප්‍රේල් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට්* පත්‍රය *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - කන්තලේ**

නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කන්තලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කර ඇති වැලි කියුබ් **146** ක්, බොරළු කියුබ් **25** ක් හා පස් කියුබ් **07** ක් **2024.04.08** වැනි දින ප.ව. **1.00** ට කන්තලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි වෙන්දේසි කරනු ලබන කිසියම් නඩු භාණ්ඩයක් පිළිබඳව හිමිකම්පාන අයෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත නඩු භාණ්ඩයන් රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත පරීක්ෂා කර බැලිය හැකිය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන නඩු භාණ්ඩයන් එම අවස්ථාවේ දීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

05. වෙන්දේසියට සහභාගී වන අයවලුන් ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් රැගෙන පැමිණිය යුතුය.

06. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

එච්. දිනිඳු සමරසිංහ,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,

දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
කන්තලේ.

03 - 428

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - නිකවැරටිය**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද වාහන හා භාණ්ඩයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව ඉදිරිපත් කරනු ලැබූ හා රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියෝග කරන ලද පහත සඳහන් වාහන සහ භාණ්ඩයන් **2024.04.20** වැනි දින **පෙ.ව. 09.30** ට නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන්වන කිසියම් වාහනයක් හෝ භාණ්ඩයක් පිළිබඳව හිමිකම් කියාපාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත වාහනයන් හා භාණ්ඩයන් මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවල අධිකරණයේ අභිමතය පරිදි එම වාහනයක් හා භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා වාහනයන් හා භාණ්ඩයන් සඳහා එම අවස්ථාවේදී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත්/මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. වෙන්දේසි භූමියට පැමිණෙන අය තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

චාන්දන ලියනගේ,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්.

2024 මාර්තු මස 22 වැනි දින,
නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | | *වෙනත් කරුණු* | *ප්‍රමාණය* |
|---|---|---|---|---|---|
| 01 | 61834/58768 | BEW - 0480 | යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 02 | 49266 | BHA - 2021 | යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 03 | 46200 | BGO - 4550 | යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 04 | 48935 | BAR - 3281 | යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 05 | 52274 | BEH - 0492 | යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 06 | 50576 | BFR - 2620 | යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 07 | 61669 | XB - 8585 | යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 08 | AR/86/23 | MU - 8759 | යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 09 | 44131 | WV - 8610 | යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 10 | 38848 | BFD - 0582 | යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 11 | 48273 | BCJ - 1177 | යතුරු පැදිය | වාහනයක් ලෙස | 01 |
| 12 | 35640 | LB - 4628 | ලොරි රථය | වාහනයක් ලෙස | 01 |
| 13 | 48727 | VH - 4003 | යතුරු පැදිය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| 14 | 50519 | WG - 7326 | යතුරු පැදිය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| 15 | 15368 (B/27/12) | N/A | අත් ට්‍රැක්ටරය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | | වෙනත් කරුණු | ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 16 | 61012 | N/A | අත් ට්‍රැක්ටරය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| 17 | 36035 | LB - 9888 | ලොරි රථය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| 18 | 36587 | N/A | අත් ට්‍රැක්ටරය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| 19 | 9796 | 103-6286 | යතුරු පැදිය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| 20 | 31423 | PT - 1694 | ලොරි රථය | පාවිච්චි කරන ලද අමතර කොටස් ලෙස | 01 |
| 21 | 51509 | 12.5 kg ලිට්රෝ වර්ගයේ ගෑස් සිලින්ඩර් | | - | 01 |
| 22 | 51509 | ගෑස් ලිප් | | - | 01 |
| 23 | 56871 | 12.5 kg ලිට්රෝ වර්ගයේ ගෑස් සිලින්ඩර් | | - | 01 |
| 24 | 56871 | ගෑස් ලිප් | | - | 01 |
| 25 | 64925 | 12.5 kg ලිට්රෝ වර්ගයේ ගෑස් සිලින්ඩර් | | - | 01 |
| 26 | 64925 | ගෑස් ලිප් | | - | 01 |
| 27 | 66652 | 12.5 kg ලිට්රෝ වර්ගයේ ගෑස් සිලින්ඩර් | | - | 01 |
| 28 | 66652 | ගෑස් ලිප් | | - | 01 |
| 29 | 59297 | 5 kg ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩර් | | - | 01 |
| 30 | 59297 | ගෑස් ලිප් | | - | 01 |
| 31 | අංක රහිත | පාපැදි | | - | 25 |
| 32 | පරිගණක බැටරි (යූපීඑස්) | භාණ්ඩ සමීක්ෂණයෙන් වෙන්දේසියට යොමු කරන ලද | | - | 03 |

03 - 480

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - මහනුවර**

මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රමාණයක් හා වාහන 01 ක් **2024 අප්‍රේල් මස 27 දින පෙ.ව. 9.00** ට මෙම අධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි සඳහන්වන කිසියම් භාණ්ඩයක් හෝ වාහනය සම්බන්ධයෙන් හිමිකම් දක්වීමට අපේක්ෂා කරන තැනැත්තන් වෙන්දේසිය පැවැත්වෙන දින **පෙ.ව. 9.00** ට පෙර ස්වකීය හිමිකම තහවුරු කිරීමට අදාළ සාධක රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින **පෙ.ව. 8.00** සිට **පෙ.ව. 9.00** දක්වා වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ හා වාහනය පරීක්ෂා කර බැලිය හැක.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම අයිතමයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් ලබා ගන්නා සියලුම භාණ්ඩ හා වාහනය සඳහා ගෙවීම් එම අවස්ථාවේ දී ම ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ගෙවා එදින **ප.ව. 3.00** ට පෙර එම අයිතමයන් අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

05. වෙන්දේසි භූමියට පැමිණෙන සෑම තැනැත්තෙකු ම ස්වකීය ජාතික හැඳුනුම්පත ඉදිරිපත්කර අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

ශ්‍රීනිත් විජේසේකර,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - මහනුවර.

2024 මාර්තු මස 18 වැනි දින,
මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ 2024.04.27 දින භාණ්ඩ වෙන්දේසියට අදාළ ලැයිස්තුව**

| *අනු. අංකය* | *නඩු අංකය* | *විස්තරය* |
|---|---|---|
| 01 | B 47354/18 | ජංගම දුරකථනයක් |
| 02 | 77032/24 | රූපවාහිනියක් |
| 03 | 77741/24 | යකඩ තාච්චි 01<br>යකඩ සවල් 01 |
| 04 | 48002/20 | තඹ පටි 5.938 kg |
| 05 | AR 7039/24 | ජංගම දුරකථන 01 |
| 06 | AR 7040/24 | ජංගම දුරකථන 01 |
| 07 | AR 7041/24 | ජංගම දුරකථන 01 |
| 08 | AR 7043/24 | ජංගම දුරකථන 01 |
| 09 | අංක රහිත | ඇලුමිනියම් තාච්චි 01 |
| 10 | අංක රහිත | ගෑස් ලිපක් (තනි ලිප) |
| 11 | අංක රහිත | ගෑස් ලිපක් (ලිප් 02) |
| 12 | අංක රහිත | තරාදි තැටියක් |
| 13 | අංක රහිත | විදුලි පන්දමක් |
| 14 | අංක රහිත | ලීටර් 20 හිස් වතුර බෝතල් 02 |
| 15 | අංක රහිත | උදලු 02 ක් |
| 16 | අංක රහිත | ඇලුමිනියම් මුට්ටියක් |
| 17 | අංක රහිත | ප්ලාස්ටික් තැටි 02 ක් |
| 18 | අංක රහිත | ප්ලාස්ටික් පැදුරක් |

| *අනු. අංකය* | *නඩු අංකය* | *විස්තරය* |
|---|---|---|
| 19 | අංක රහිත | ප්‍රෙෂර් කුකර් 01 ක් |
| 20 | අංක රහිත | තාච්චියක් හා සවලක් |
| 21 | අංක රහිත | මදර් බෝඩ් එකක් |
| 22 | අංක රහිත | ලොකු කුඩයක් |
| 23 | අංක රහිත | කිරි එකතු කරන ඇලුමිනියම් භාජනයක් |
| 24 | අංක රහිත | ගෑස් තනි ලිපක් |
| 25 | අංක රහිත | රෙගියුලේටර් 02 |
| 26 | අංක රහිත | බෆල් එකක් |
| 27 | අංක රහිත | සවල් 02 |
| 28 | අංක රහිත | ජංගම දුරකථන 01 |
| 29 | අංක රහිත | ජංගම දුරකථන 01 |
| 30 | අංක රහිත | ජංගම දුරකථන 01 |

**මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ 2024.04.27 දින වාහන වෙන්දේසිය**

| *අනු අංකය* | *නඩු අංකය* | *වාහන අංකය* | *විස්තරය* |
|---|---|---|---|
| 01 | 54899/21 | CP PE - 8832 වැන් රථය | ලියාපදිංචි කළ නොහැක |

03 - 444

---

# රජයේ නොවන දැන්වීම්

2007 අංක 7 දරන සමාගම් පනතේ 346(1) වන වගන්තිය ප්‍රකාර වූ නිවේදනය

**බයෝමාස් සප්ලයිස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගම්අංකය : පීවී 76480

**ඇවරකරුවකු පත් කිරීමේ නිවේදනය**

වර්ෂ 2023 ක් වූ ජුනි මස 23 වැනි දින බස්නාහිර පළාත් වාණිජ මහාධිකරණය විසින් පවත්වනු ලැබූ නඩු අංක CHC 096/2021/CO ට අදාළ නඩු වාරයේ දී බයෝමාස් සප්ලයිස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ඇවරකරු වශයෙන් සමාගමේ උසාවි නියෝගය තුළින් මා පත් කරන ලද බව කොළඹ 3, පාසල් වීදියේ අංක 9, 2/3, 03 මහලේ වරලත් ගණකාධිකාරී සුමිත් රන්වත්ත වන මම මෙයින් නිවේදනය කරමි.

සුමිත් රන්වත්ත,
වරලත් ගණකාධිකාරී,
ඇවරකරු.

තුන්වන මහල, 2/3, අංක 09,
පාසල් වීදිය, කොළඹ 03.

03 - 450

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ඩී. එෆ්. සී. සී. බැංක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ (ඩී. එෆ්. සී. සී. බැංක් පීඑල්සී හි අනුප්‍රාප්තික) ඩී. එෆ්. සී. සී. බැංක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ඩී. අයි. එන්. තිලකරත්න විසින් ලියා සහතික කරන ලද 2015.05.06 දිනැති අංක 465 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම් කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ PV 64731 අංකය යටතේ ලියාපදිංචි කොට සිය ලියාපදිංචි කාර්යාලය, කොළඹ 08 හි පවත්වාගෙන යන ක්වින්ටන් ස්කොට් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින් ද,

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා බලසීමාව ඇතුළත දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 534 A දුටුගැමුණු ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කලුබෝවිල පිහිටි සිරිගල් මාවත, වරිපනම් අංක 21 A දරන බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද 2005.05.17 දිනැති අංක 3368/9000 දරන මැනුම් පිඹුරේ ලොට් X (බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්ලිව්. අබේසිංහ විසින් මැන සාදන ලද 1988.08.12 දිනැති අංක 2997 දරන පිඹුරේ ලොට් 4 A, 4 B, සහ 4 C හි ඒකාබද්ධ කිරීමක් වන) වශයෙන් දක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට එකී අංක 3368/9000 පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි හයක් (රූ. 1, පර්. 26) *හෙවත්* හෙක්ටයාර් 0.1669 ක් විශාල ඉඩම් සහ එහි පිහිටි පස, ගහකොළ, ගොඩනැගිලි ඇතුළ සියලු දේ වේ. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත. ඉහත සඳහන් දේපළ,

**2024 මැයි මස 02 වැනි දින පෙරවරු 09.30 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - නුගේගොඩ මංසන්ධියේ සිට (හයිලෙවල් පාර) පල්ලිය වීදිය ඔස්සේ මීටර් 400 ක පමණ දුරක් ගොස් කොහුවල මංසන්ධිය දක්වා පැමිණ කළුබෝවිල රෝහල දක්වා දිවෙන මාර්ගයට පිවිස තවත් මීටර් 300 ක පමණ දුරක් ගොස් සිරිගල් මාවත දක්වා පැමිණ වම්පසට ඇති සිරිගල් මාවතට හැරෙන්න. එම සිරිගල් මාවතේ, තවත් මීටර් 200 ක පමණ දුරක් ගිය විට වරිපනම් අංක 21A දරන අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම. - *රජයේ ගැසට් පත්‍රයේ* 2021.11.26 වැනි දින පළ වී ඇති අතර, ද අයිලන්ඩ්, දිවයින සහ තිනකුරල් යන පුවත්පත්වල 2021.11.12 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000,
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500,
6. සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහා විමසන්න. අයකර ගැනීම් සහ පුනරුත්ථාපන අංශය, ඩී. එෆ්. සී. සී. බැංක් පීඑල්සී, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02. දුරකථනය 011- 2371371.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක 011 - 3068185, 011- 2572940.

03 - 448

## ඩී.එෆ්.සී.සී. බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

දඹුල්ල පාදෙණිය ග්‍රාමයේ අළුත්වැව පාරේ පිහිටි පර්චස් 15 විශාලැති අගනා දේපළක්,

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර කොට්ඨාසයේ වගපනහ පල්ලේසිය පත්තුවේ දඹුල්ල මහ නගර සභා සීමාවේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දඹුල්ල නගරයේ ග්‍රාමසේවා නිලධාරී වසමේ දඹුල්ල සළුඅපුල්ලන වැව ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඕ. ජී. නිමලසිරි විසින් 2004 පෙබරවාරි මස 20 වැනි දින සාදන ලද අංක 2004/225 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කරන ලද කැබලි අංක 18 දරන ඉඩම,

ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් 2019 ඔක්තෝබර් මස 3 වැනි දින සහතික කරන ලද අංක 24978 දරන DFCC Bank PLC නමට ලියන ලද්දා වූ බැඳුම්කරය මත අයවිය යුතු මුදල ගෙවීමට ප්‍රදීප් හපුආරච්චි ණයකරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරණ ලද බලය මත ඉහත සඳහන් දේපළ,

**2024 ක් වූ අප්‍රේල් මස 22 වැනි දින පෙ.ව. 11.45 ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩිදුර විස්තර සඳහා.* - 2023.11.03 දින *රජයේ ගැසට් පත්‍රය* ද 2023.10.23 වැනි දින "දිවයින", "දි අයිලන්ඩ්" සහ 2023.11.06 "තිනක්කුරල්" යන පුවත්පත් බලන්න.

දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය. - දඹුල්ල හෝරාස්ථම්භ මංසන්ධිය අසළ සිට කුරුණෑගල පාරේ කි.මී. 1.2 ක් පමණ දඹුල්ල අධිකරණ සංකීර්ණය (දකුණට පිහිටා ඇති) දක්වා ගමන් කර සළුඅපුල්ලන වැව පාරට හැරී මීටර් 200 ක් පමණ තුන්මංසන්ධිය දක්වා ගමන් කර අළුත්වැව පාරට හැරී ඉදිරියට මීටර් 100 ක් පමණ ගමන් කිරීමෙන් නැවත ඉන්ටර්ලොක් කර ඇති පාරට හැරී මීටර් 50 ක් පමණ ඉදිරියට ගමන් කිරීමෙන් පසු පාරේ වම් පසින් අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද,
3. වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බදුද,
4. සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500/- ක් ද,
6. වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 73, ඩීඑෆ්සීසී බැන්ක් හි ජ්‍යෙෂ්ඨ ණය සම්බන්ධීකරණ කළමණාකාරිනී, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න.

දුරකථන අංක : 0112371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777672082
ෆැක්ස් : 2871184.

03 - 435

---

## ඩී.එෆ්.සී.සී. බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

දඹුල්ල පාදෙණිය ග්‍රාමයේ අළුත්වැව පාරේ පිහිටි පර්චස් 27 විශාලැති අගනා දේපළක්,

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර කොට්ඨාසයේ වගපනහ පල්ලේසිය පත්තුවේ දඹුල්ල මහ නගර සභා සීමාවේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දඹුල්ල නගරයේ ග්‍රාමසේවා නිලධාරී වසමේ දඹුල්ල සළුඅපුල්ලන වැව ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින්

2008 සැප්තැම්බර් මස 14 වැනි දින සාදන ලද අංක 4250 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කරන ලද කැබලි අංක A දරන ඉඩම,

ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් 2019 ඔක්තෝබර් මස 3 වැනි දින සහතික කරන ලද අංක 24976 දරන DFCC Bank PLC නමට ලියන ලද්දා වූ බැඳුම්කරය මත අයවිය යුතු මුදල ගෙවීමට ප්‍රදීප් හපුආරච්චි ණයකරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරණ ලද බලය මත ඉහත සඳහන් දේපළ,

**2024 ක් වූ අප්‍රේල් මස 22 වැනි දින පෙ.ව. 11.30 ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩිදුර විස්තර සඳහා.* - 2023.11.03 දින *රජයේ ගැසට් පත්‍රය ද* 2023.10.23 දින "දිවයින", "දි අයිලන්ඩ්" සහ 2023.11.06 "තිනකුරල්" යන පුවත්පත් බලන්න.

දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය. - දඹුල්ල හෝරාස්ථම්භ මංසන්ධිය අසළ සිට කුරුණෑගල පාරේ කි.මී. 1.2 ක් පමණ දඹුල්ල අධිකරණ සංකීර්ණය (දකුණට පිහිටා ඇති) දක්වා ගමන් කර සළුඅපුල්ලන වැව පාරට හැරී මීටර් 200 ක් පමණ තුන්මංසන්ධිය දක්වා ගමන් කර අළුත්වැව පාරට හැරී ඉදිරියට මීටර් 100 ක් පමණ ගමන් කිරීමෙන් පසු පාරේ දකුණු පසින් අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද,
3. වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බදුද,
4. සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500/- ක් ද,
6. වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතික සඳහා මුද්දර බදු ද වේ. ගැණුම් මිලෙන් 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 73, ඩීඑෆ්සීසී බැන්ක් හි ජ්‍යෙෂ්ඨ ණය සම්බන්ධිකරණ කළමණාකාරිනී, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න.
දුරකථන අංක : 0112371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777672082
ෆැක්ස් : 2871184.

03 - 436

---

## ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

උඩුනුවර ගම්පළාත දෙහිපාගොඩ පිහිටා ඇති පර්චස් 20 ක් විශාලැති අගනා ඉඩම් කැබැල්ලක්,

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ කුඹියාවත්ත ග්‍රම නිළධාරී වසමේ උඩුනුවර ගම්පළාත දෙහිපාගොඩ පිහිටා ඇත්තා වූ "අගරදෙණිය හේන සහ ගුරුදෙණිගොඩ හේන දැන් සැක්ලිට්ෆ් එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට (බලයලත් මිනින්දෝරු ආර්. සී. ඕ. ඩී. ල මොටේ විසින් 1969 සැප්තැම්බර් මස 7 සහ 8 වැනි දිනයන්හි සාදන ලද අංක 3871 දරන පිඹුරේ (නැවත මිණුම්ගතකළ) බලයලත් මිනින්දෝරු වාඩුඩ් විසින් 2003 පෙබරවාරි මස 4 වැනි දින සාදන ලද අංක 2143 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 දරන බෙදා වෙන් කරන ලද නිශ්චිත ඉඩම් කැබැල්ල.

ප්‍රසිද්ධ නොතාරිස් ඊ. එම්. පී. ඩබ්ලිව්. ටී. එස්. ඒකනායක විසින් 2019 ජුනි මස 21 වැනි දින සහතික කරන ලද ඩීඑෆ්සීසී පීඑල්සී බැංකුව නමින් ලියන ලද අංක 549 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීමට හේරත් මුදියන්සේලාගේ හිරෝෂා විශාකා කුමාරි විසින් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ,

**2024 ක් වූ අප්‍රේල් මස 24 වැනි දින පෙ.ව. 11.30 ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩිදුර විස්තර සඳහා.* - 2022.11.25 වන දින *රජයේ ගැසට් පත්‍රය ද* 2022.09.27 වැනි දින "දිවයින", "දි අයිලන්ඩ්" සහ "තිනකුරල්" යන පුවත්පත් බලන්න.

දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය. - ගෙළිඔය බස් නැවතුම්පොළ සිට ගම්පොළ දෙසට මීටර් 70 ක් පමණ ගමන් කර වමට හැරී කළුගමුව පාරේ (දුම්රියපොළ පාර) මීටර් 80 ක් පමණ ඉදිරියට ගොස් දකුණට හැරී කම්බියාවත්ත පාරේ (බෑවුම් සහිත පාර) දුම්රිය හරස් මාර්ගය පසුකර මීටර් 170 ක් පමණ ඉදිරියට ගොස් දකුණට හැරී අඩි 10 ක් පළලැති පාරේ මීටර් 30 ක් පමණ ගමන් කිරීමෙන් පසු අදාළ දේපළ පාරේ දකුණු පසින් පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද,
3. වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බදුද,
4. සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500/- ක් ද,
6. වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතික සඳහා මුද්දර බදු ද වේ. ගැණුම් මිලෙන් 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 73, ඩීඑෆ්සීසී බැන්ක් හි ජ්‍යෙෂ්ඨ ණය සම්බන්ධීකරණ කළමණාකාරිනී, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න.
දුරකථන අංක : 0112371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777672082
ෆැක්ස් : 2871184.

03 - 442

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පදවි පරාක්‍රමපුර ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩපොළ, ඕතොට කෝරළේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ දකුණු පොතල්ගහවෙල අංක 938 ග්‍රාම නිලධාරී වසමේ ගලබඩගම කාහඩිවල හි ගලහිටියාවේවත්ත නමැති ඉඩමෙහි, වර්පනම් අංක 21/85 දරන ස්ථානයෙහි පිහිටි, විශාලත්වයෙන් රූඩ් එකයි පර්චස් දහඅටයි දශම අටක (රූ. 01, පර්. 18.8) කින් යුක්ත වූ වටිනා ඉඩම සමග ගොඩනැගිලි වගාවන් සහ එහි පිහිටි සියළුම දේත් සමග.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් සහතික කරන ලද්දවූ ද, 2013 ජූලි මස 29 වැනි දින සහතික කළ අංක 18571 සහ 2014 ඔක්තෝබර් මස 31 වැනි දින සහතික කළ අංක 19779 දරන උකස් බැඳුම්කර යටතේ අය විය යුතු මුදල් ගෙවීම වික්‍රම ආරච්චිගේ රුවන් කුමාර *හෙවත්* වික්‍රම ආරච්චිලාගේ රුවන් කුමාර වික්‍රමආරච්චි විසින් පැහැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව, එකී බැඳුම්කර යටතේ අය විය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම සඳහා, මෙහි පහත සඳහන් උපලේඛනයන් හි දැක්වෙන දේපළ,

වර්ෂ **2024 අප්‍රේල් මස 19 වැනි දින** පෙරවරු **9.00 ට,**

එකී දේපළ, පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩපොළ, ඕතොට කෝරළේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ දකුණු පොතල්ගහවෙල අංක 938 ග්‍රාම නිළධාරී වසමේ ගලබඩගම කාහඩිවල හි පිහිටි ගලහිටියාවේවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. හේරත් විසින් 2007 ජනවාරි මස 14 වැනි දින පිළියෙල කරන ලද අංක 3839 A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01, 03 සහ 04 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් : උතුරට : ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයිති ඉඩම සහ ලොට් 02 න් ද, නැගෙනහිරට : ඊ. පී. සෝමපාලගේ ඉඩම සහ පාතිමා රිස්වියාගේ ඉඩමෙන් ද, දකුණට : අංක 3839 දරන පිඹුරේ (අඩි පාර) ලොට් 11 සහ 05 න් ද, බස්නාහිරට : අංක 3839 දරන පිඹුරේ ලොට් 12 පාරෙන් ද, මායිම් වූ එකී අංක 3839ඒ දරන පිඹුරේ ලොට් 05 සහ 02, අංක 3839 දරන පිඹුරේ ලොට් 12

වශයෙන් දැක්වෙන මාර්ගයේ එහා මෙහා ගමන් කිරීමේ අයිතිය සමග පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් දහඅටයි දශම අටක (රූ. 01, පර්. 18.8) ක විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමග ගොඩනැගිලි වගාවන් සහ එහි පිහිටි සියළුම දේත් සමග වේ.

ඉහත සඳහන් පසුව ඒකාබද්ධ කරන ලද ගලබඩගම කහදිවල හි පිහිටි ගලහිටියාවේවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. හේරත් විසින් 2013 ජූලි 13 වැනි දින පිළියෙල කරන ලද අංක 9774 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01A වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් : උතුරට : ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයිති ඉඩම සහ ලොට් 1B න් ද, නැගෙනහිරට : ඊ. පී. සෝමපාලගේ ඉඩම සහ පාතිමා රිස්වියාගේ ඉඩමෙන් ද, දකුණට : ඉහත සඳහන් ලොට් 1C සහ අංක 3839 දරන පිඹුරේ ලොට් 11න් ද, බස්නාහිරට : අංක 3839 දරන පිඹුරේ ලොට් 12 පාරෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් දහඅටයි දශම අට (රූ. 01, පර්. 18.8) ක විශාලත්වයෙන් යුක්ත වේ.

*අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා* .- 2018.06.14 වැනි දින සහ 2022.06.17 රජයේ ගැසට් පත්‍රය ද, 2018.06.19 වැනි දින සහ 2022.06.24 වැනි දින ඩේලි මිරර්, මව්බිම සහ තිනකුරල් පුවත්පත් බලන්න.

දේපළට පිවිසීම. - බැංකු වටුවමේ සිට හරිස්චන්ද්‍ර මාවත ඔස්සේ රෝහල් හන්දිය දක්වා කි. මී. 1 1/2 පමණ ගමන් කර පසුව වමට හැරී බණ්ඩාරනායක මාවතට ගොස් බණ්ඩාරනායක මාවත ඔස්සේ කිලෝමීටර් 1 1/2 පමණ ගොස් ගුවන් තොටුපළ හන්දිය දක්වා ගමන් කළ යුතු ය. ඉන් පසු වමට හැරී කිලෝමීටර් 1 1/4 පමණ ඉදිරියට ගොස් නුගේ හන්දියට පිවිස වමට හැරී මීටර් 300ක් පමණ ඉදිරියට ගොස් තුංමං හන්දියෙන් දකුණට ඇති බොරළු පාරට පිවිසෙන්න. බොරළු පාර දිගේ මීටර් 200ක් පමණ ඉදිරියට ගොස් ඉන්පසු වමට ඇති බොරළු පාරට හැරී තවත් මීටර් 75 ක් ඉදිරියට ගොස් අදාළ දේපළ වෙත ළඟා වන්න. අදාළ දේපළ පිහිටා ඇත්තේ විජය මාවතෙ හි දකුණු පස වරිපනම් අංක 21/85 දරන ස්ථානයෙහි ය.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු ද, 3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු ද, 4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද, 5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 2,000 ක් ද, 6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000 ක් ද වේ.

තවද, ගැණුම් මිලෙන් සියයට අනූවක් (90%)ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින (30) තිහක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු වේ. තවද දින (30) තිහක් ඇතුලත ඉතිරි මුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහය (10%) ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා. - ජ්‍යෙෂ්ඨ කළමනාකාර - වාණිජ අයකිරීම්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011 - 2661833, 011- 2661836, 011- 2661826.

කේ. පී. එන්. සිල්වා (සා. වි.)
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්.

අංක 109/12A, ගෝතමී පාර,
බොරැල්ල, කොළඹ 08
දුරකථන අංක : 011- 2687762, 077 - 8441812.

03 - 490

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පදවි පරාක්‍රමපුර ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පදවි පරාක්‍රමපුර මහා වීදියේ, වරිපනම් අංක 388/බී දරන පරිශ්‍රයේ තබා ඇති හෝ ගබඩා කොට ඇති වෙළඳ භාණ්ඩ සම්භාරය සහ උපකරණ වශයෙන් හැඳින්වෙන වෙළඳ භාණ්ඩ, තනි තනි වශයෙන් සහ සමූහ වශයෙන්, යන්ත්‍ර සූත්‍ර සවි කිරීම්, තනි තනිව හා සමූහ වශයෙන්, සහ සෑම වර්ගයකම චංචල බඩු බාහිරාදිය, ගබඩා ඉස්ටෝරු පරිශ්‍ර, අතැති යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ හා සෑම වර්ගයක ම චංචල භාණ්ඩ,

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් සහතික කරන ලද්දවූ ද, 2013 ජූලි මස 29 වැනි දින සහතික කළ අංක 18571 සහ 2014 ඔක්තෝබර් මස 31 වැනි දින සහතික කළ අංක 19779 දරන උකස් බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම වික්‍රම ආරච්චිගේ රුවන් කුමාර *හෙවත්* වික්‍රම ආරච්චිලාගේ රුවන් කුමාර වික්‍රමආරච්චි විසින් පැහැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත

පවරා ඇති බලතල වලට අනුව, එකී බැඳුම්කර යටතේ අය විය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම සඳහා, මෙහි පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන දේපළ,

වර්ෂ **2024 අප්‍රේල් මස 18 වැනි දින පෙරවරු 11.00 ට,**

එකී දේපළ, පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පදවි පරාක්‍රමපුර මහා වීදියේ, වරිපනම් අංක 388/බී දරන පරිශ්‍රයේ තබා ඇති හෝ ගබඩා කොට ඇති (මින් ඉදිරියට ණයකරුට සහ/හෝ එකී තනි පුද්ගල ව්‍යාපාරයට අයත් මුළු වෙළඳ භාණ්ඩ සම්භාරය සහ උපකරණ වශයෙන් හැඳින්වෙන) වෙළඳ භාණ්ඩ තනි තනි වශයෙන් සහ සමූහ වශයෙන් යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් තනි තනිව හා සමූහ වශයෙන් සහ සෑම වර්ගයක ම චංචල බඩු බාහිරාදිය සහ ණයකරු විසින් ඉහත සඳහන් දිස්ත්‍රික්කය තුළ ණයකරු විසින් දැනට තනි ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන හෝ මතුවට පවත්වාගෙන යාමට අපේක්ෂාකරන ගබඩා, ඉස්ටෝරු, පරිශ්‍ර ඇතැති යන්ත්‍ර සූත්‍ර සහ යන්ත්‍රෝපකරණ හා සෑම වර්ගයකම චංචල භාණ්ඩ,

| *සාමාන්‍ය උතුරවන ඒකකය අංකය* | *විස්තරය* | *නියම වටිනාකම රු. ශත* | *වලංගු වෙළඳ වටිනාකම රු. ශත* |
|---|---|---|---|
| 01 | පැඩි ක්ලිනර් | 495,000.00 | 495,000.00 |
| 02 | සොකින් ටැන්ක් | 3,200,000.00 | |
| 03 | ස්ටීම් ටැන්ක් ස්කොයාර් | 320,000.00 | 304,000.00 |
| 04 | ස්ටීම් ටැන්ක් සර්කියුලර් | 270,000.00 | 265,500.00 |
| 05 | එලිවේටර් | 225,000.00 | 213,750.00 |
| 06 | බොයිලර් | 1,025,000.00 | 1,005,000.00 |
| 07 | හස්ක් ෆීඩිංග් බ්ලෝවර් | 225,000.00 | 213,500.00 |
| 08 | ඇෂ් ෆීඩිංග් බ්ලෝවර් | 125,000.00 | 118,750.00 |
| 09 | ඇෂ් ස්ටොරේජ් රූම් | 175,000.00 | |
| 10 | ග්‍රේන් ඩ්‍රයර් | 775,000.00 | 760,500.00 |
| 11 | ෆීඩර් බ්ලෝවර් | 125,000.00 | 122,500.00 |
| 12 | ඩ්‍රයර් 15000 කි.ග්‍රෑම් | 1,950,000.00 | 1,911,000.00 |
| 13 | හීට් එක්ස්චේන්ජර් | 280,000.00 | 274,400.00 |
| | | **9,245,000.00** | **8,791,150.00** |

| *මිලියන ඒකකය අංකය* | *විස්තරය* | *නියම වටිනාකම රු. ශත* | *වලංගු වෙළඳ වටිනාකම රු. ශත* |
|---|---|---|---|
| 01 | පැඩි ක්ලිනර් | 270,000.00 | 264,600.00 |
| 02 | ජෙට් පොලිෂර් | 530,000.00 | 519,000.00 |
| 03 | පොලිෂර් | 275,000.00 | 259,000.00 |
| 04 | කම්බිනේෂන් හලර් | 575,000.00 | 563,500.00 |
| 05 | පැඩි ක්ලීනර් | 325,000.00 | 318,500.00 |
| 06 | ග්‍රේඩර් | 540,000.00 | 529,200.00 |
| 07 | එලිවේටර් - 10,14,24 | 216,000.00 | 205,200.00 |
| 08 | ඩස්ට් සෙපරේටර් | 230,000.00 | 218,500.00 |
| 09 | ඩස්ට් බ්ලෝවර් | 170,000.00 | 161,500.00 |
| 10 | වෙයිංග් ස්කේල්(තරාදි) 3 ක් | 105,000.00 | 94,500.00 |
| 11 | පැනල් බෝඩ් | 225,000.00 | 220,500.00 |
| 12 | කැපසිටර් බැන්ක් | 475,000.00 | 465,500.00 |
| | | **3,936,000.00** | **3,819,500.00** |

ශ්‍රේණිගත ඒකකය

| | | | |
|---|---|---|---|
| 01 | කලර් සෝටර් | 4,375,000.00 | 4,156,250.00 |
| 02 | එලිවේටර් 3 ක් | 360,000.00 | 342,000.00 |
| 03 | පැඩි ස්ටෝරේජ් ටැන්ක් (වී ගබඩා කිරීමේ ටැංකි) 2 | 225,000.00 | 213,750.00 |
| 04 | ඊ-ස්කේල් | 38,000.00 | 36,100.00 |
| 05 | පැඩි ග්‍රේඩර් | 310,000.00 | 294,500.00 |
| 06 | සීලින් මැෂින් | 3,500.00 | 3,325.00 |
| 07 | ඩස්ක් බ්ලෝවර් | 140,000.00 | 133,000.00 |
| 08 | කම්ප්ලීට් කැබින් | 240,000.00 | 228,000.00 |
| | | 5,691,500.00 | 5,406,925.00 |
| | **සම්පූර්ණ වටිනාකම** | **18,872,500.00** | **18,017,575.00** |

*අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා .-*

2018.06.14 වැනි දින සහ 2022.06.17 රජයේ *ගැසට්* පත්‍රය ද, 2018.06.19 වැනි දින සහ 2022.06.24 වැනි දින ඬේලි මිරර්, මව්බිම සහ තිනකුරල් පුවත්පත් බලන්න.

දේපළට පිවිසීම. - කැබිතිගොල්ලෑව නගරයේ සිට පදවිය නගරයට පිවිස එතැන් සිට කි. මී. 10ක් ගමන් කළ පසු පදවි පරාක්‍රම නගරය හමුවේ. එතැන් සිට කි. මී. 11 ගමන් කොට ශ්‍රී පුර නගරයට පිවිස, ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසල සිට මීටර් 50 ක් පමණ දුරින් ඇති අදාළ චංචල දේපළ තබා ඇති ස්ථානයට ළඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
2. පළාත් පාලන ආධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තියමය ගාස්තු ද,
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 2,000 ක් ද,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000 ක් ද වේ.

තවද, ගැණුම් මිලෙන් සියයට අනූවක් (90%)ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින (30) තිහක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු වේ. දින (30) තිහක් ඇතුලත ඉතිරි මුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක් මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා.* -
ජ්‍යෙෂ්ඨ කළමනාකාර - වාණිජ අයකිරීම්,
හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.,
අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
දුරකථන අංක : 011 - 2661833, 011- 2661836, 011- 2661826.

කේ. පී. එන්. සිල්වා (සා. වි.)
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්.

අංක 109/12ඒ, ගෝතමී පාර,
බොරැල්ල, කොළඹ 08
දුරකථන අංක : 011- 2687762 - 077 - 8441812.

03 - 488

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පදවි පරාක්‍රමපුර ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාතේ නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කනදර කෝරළේ අංක 240 ග්‍රාම නිලධාරී වසමේ අත්තිකුලම ගමේ හි පිහිටි රූඩ් එකක (රූ. 01) විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමග එහි පිහිටි සියලුම දේත් සමග,

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් යූ. විජේරත්න විසින් 2013 ජූලි මස 03 වැනි දින සහතික කළ අංක 1774 සහ 2014 නොවැම්බර් මස 05 වැනි දින සහතික කළ අංක 2469 දරන උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වික්‍රම ආරච්චිගේ රුවන් කුමාර *හෙවත්* වික්‍රම ආරච්චිලාගේ රුවන් කුමාර වික්‍රමආරච්චි විසින් පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව, එකී බැඳුම්කර යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් උපලේඛනයන් හි දැක්වෙන දේපළ,

වර්ෂ **2024 ක් වූ අප්‍රේල් මස 18 වැනි දින පෙරවරු 10.00 ට,**

එකී දේපළ, පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත්, නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනදර කෝරළේ, අංක 240 ග්‍රාම නිළධාරී වසමේ අත්තිකුලම ගමේ හි පිහිටි ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම් : උතුරට : ඩබ්. වී. එච්. අප්පුහාමිගේ ඉඩමෙන් ද, නැගෙනහිරට : අතුරු පාරෙන් ද, දකුණට : කරුණාරත්නගේ ඉඩමෙන් ද, බස්නාහිරට : එම්. ජයරත්නගේ ඉඩමෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් එකක (රූ. 01) විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමග එහි පිහිටි සියලුම දේත් සමග වේ.

වඩාත් මෑතක දී කරන ලද මැනීමකින් පසු මෙම ඉඩම පහත සඳහන් පරිදි විස්තර වේ :

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාතේ, නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනදර කෝරළේ, අංක 240 ග්‍රාම නිලධාරී වසමේ අත්තිකුලම ගමේ හි පිහිටි විජය මාවතේ, වරිපනම් අංක 21/82 දරන ඉඩමට නොතාරිස් ආර්. බී. අබේසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 841 ඔප්පුවට බලයලත් මිනින්දෝරු ජේ. ටී. ගලගෙදර විසින් 2008 පෙබරවාරි මස 07 වැනි දින පිළියෙල කරන ලද අංක 2033 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් : උතුරට : ඩබ්. වී. එච්. අප්පුහාමිගේ ඉඩමෙන් ද, නැගෙනහිරට : වෙන්කරන ලද පාර (එම්. සී.), දකුණට : වෙන්කරන ලද පාර (එම්.සී.), බස්නාහිරට : බලය නොලත් අනුර රත්නායකගේ ඉඩමෙන් ද, මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් එකක් (රූ. 01) *හෙවත්* හෙක්ටයාර් බිංදුවයි දශම එකයි බිංදුවයි එකයි එක හෙක්ටයාර් 0.1011 ක විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළුම දේත් සමඟ වේ.

*අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා .-* 2018.06.14 වැනි දින සහ 2022.06.17 දින රජයේ *ගැසට්* පත්‍රයද, 2018.06.19 වැනි දින සහ 2022.06.24 වැනි දින ඩේලි මිරර්, මව්බිම සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - බැංකු වටුමේ සිට හරිස්චන්ද්‍ර මාවත ඔස්සේ රෝහල් හන්දිය දක්වා කි. මී. 1 1/2 පමණ ගමන් කර පසුව වමට හැරී බණ්ඩාරනායක මාවතට ගොස් බණ්ඩාරනායක මාවත ඔස්සේ කිලෝමීටර් 1 1/2 පමණ ගොස් ගුවන් තොටුපොළ හන්දිය දක්වා ගමන් කළ යුතු ය. ඉන්පසු වමට හැරී කිලෝමීටර් 1 1/4 පමණ ඉදිරියට ගොස් නුගේ හන්දියට පිවිස වමට හැරී මීටර් 300 ක් පමණ ඉදිරියට ගොස් තුංමං හන්දියෙන් දකුණට ඇති බොරළු පාරට පිවිසෙන්න. බොරළු පාර දිගේ මීටර් 200ක් පමණ ඉදිරියට ගොස් ඉන්පසු වමට ඇති බොරළු පාරට හැරී තවත් මීටර් 75ක් ඉදිරියට ගොස් අදාළ දේපළ වෙත ළඟා වන්න. අදාළ දේපළ පිහිටා ඇත්තේ විජය මාවතෙහි දකුණු පස වරිපනම් අංක 21/85 දරන ස්ථානයෙහි ය.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
2. පළාත් පාලන ආධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු ද,
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 2,000 ක් ද,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000 ක් ද වේ.

තවද, ගැණුම් මිලෙන් සියයට අනූවක් (90%)ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින (30) තිහක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු වේ. දින (30) තිහක් ඇතුලත ඉතිරිමුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක් මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීම ට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා.* -
ජ්‍යෙෂ්ඨ කළමනාකාර - වාණිජ අයකිරීම්,
හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.,
අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
දුරකථන අංක : 011 - 2661833, 011- 2661836, 011- 2661826.

කේ. පී. එන්. සිල්වා (සා. වි.)
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්.

අංක 109/12ඒ, ගෝතමී පාර,
බොරැල්ල, කොළඹ 08
දුරකථන අංක : 011- 42686672 - 077 - 8441812.

03 - 489

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ගම්පොල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බදුල්ල දිස්ත්‍රික්කයේ , මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහියංගනය ප්‍රාදේශීය සභා සීමාව තුළ වැව්ගම්පහ ග්‍රාම නිලධාරී වසම තුළ සොරබොර පිහිටි "කුඩුවිල" නමැති ප්‍රමාණයෙන් රූඩ් දෙකක (රූ. 02) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සෑම සියලු දේද සමග වේ.

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට, මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2018.01.29 දිනැති අංක 4808 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සොරබොර විලේජ් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් සහ ගාරදි පුංචහේවාගේ කරුණාරත්න උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව, එකී බැඳුම්කර යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් උපලේඛනයන් හි දැක්වෙන දේපළ,

වර්ෂ **2024** ක් වූ අප්‍රේල් මස **22** වැනි දින පෙරවරු **09.30** ට,

එකී දේපළ, පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බින්තැන්න කෝරළේ, මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහියංගන ප්‍රාදේශීය සභා සීමාව තුළ වැව්ගම්පහ ග්‍රාම නිලධාරී වසම තුළ සොරබොර පිහිටි "කුඩුවිල" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එම්. චන්ද්‍රරත්න විසින් සාදන ලද අංක 3105 සහ 2015.05.24 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : ආර්. එම්. චන්ද්‍රා රාජපක්ෂ හිමිකම්පාන ලද ඉඩම ද, නැගෙනහිරට : පාර සඳහා වෙන්කිරීම ද, දකුණට: වැව්ගම්පහ ග්‍රාමනිලධාරී කාර්යාලයේ ඉඩම් පරිශ්‍රය සහ බස්නාහිරට : අංක 6005 දරන පිඹුරේ ලොට් 2 (සංශෝධිත පිඹුර සහ ඇළ සඳහා වෙන්කිරීම) ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (රූ.2) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සෑම සියලු දේද සමග වේ.

ඉහත කී ඉඩම, පහත දැක්වෙන ඉඩම් කොටස්වලින් බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසක් වේ.

1. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බින්තැන්න කෝරළේ, මහියංගන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහියංගන ප්‍රාදේශීය සභා සීමාව තුළ වැව්ගම්පහ ග්‍රාම නිලධාරී වසම තුළ බින්තැන්නේ කොටසක තුඩුවිල (සොරබොර වැව පාරේ) පිහිටි බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : ජයන්ත දූඩ්ගම හිමිකම්පාන ලද ඉඩම සහ පොදු ළිඳට යන පාර ද, නැගෙනහිරට : සොරබොර වැව පාර සඳහා වෙන්කිරීම ද, දකුණට : එස්. පී. ද සිල්වා විසින් හිමිකම්පාන ලද ඉඩම සහ බස්නාහිරට : එෆ් සී 1 ඇල රක්ෂිතය ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකක (රූ. 1) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සැම සියලු දේද සමග වේ.

2. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බින්තැන්න කෝරළේ, මහියංගන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහියංගන ප්‍රාදේශීය සභා සීමාව තුළ වැව්ගම්පහ ග්‍රාම නිලධාරී වසම තුළ බින්තැන්නේ කොටසක තුඩුවිල (සොරබොර වැව පාරේ) පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් සාදන ලද අංක 6798සී හා 1996.11.22 දින දරන පිඹුරේ දක්වෙන ලොට් 2 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම පිඹුරේ ලොට් 1 හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : සොරබොර වැව පාර ද, දකුණට : වැව්ගම්පහ ග්‍රාමනිලධාරී කාර්යාලය විසින් හිමිකම්පාන ඉඩම සහ බස්නාහිරට: පාර සඳහා වෙන්කිරීම ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකක් (රූ.1) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සැම සියලු දේද සමග වේ.

*අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා :*

2024.01.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2024.02.14 වැනි දින ඩේලි මිරර්, මව්බිම සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම* : මහියංගනය නගර මධ්‍යයේ බුද්ධ ප්‍රතිමාව අසල ප්‍රධාන වටරවුමෙන් ගොස් පදියතලාව දෙසට මීටර් 100 ක් ගමන් කර වමට හැරී දිඹුලාගල පාරේ මීටර් 300 ක් ගමන් කර දකුණට හැරී සොරබොර ගම පාරේ මීටර් 450 ක් ඉදිරියට ගමන් කර වම් පස ඇති විෂයගත දේපළට ළඟාවිය හැක.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් පාලන ආධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු ද,
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 2,000 ක් ද,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000 ක් ද වේ.

තවද, ගැණුම් මිලෙන් සියයට අනූවක් (90%)ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින (30) තිහක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු වේ. දින (30) තිහක් ඇතුලත ඉතිරි මුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක් මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීම ට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා.* -
ජ්‍යෙෂ්ඨ කළමනාකාර - වාණිජ අයකිරීම්,
හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.,
අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
දුරකථන අංක : 011 - 2661833, 011- 2661836, 011- 2661826.

කේ. පී. එන්. සිල්වා (සා. වි.)
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්.

අංක 109/12ඒ, ගෝතමී පාර,
බොරැල්ල, කොළඹ 08
දුරකථන අංක : 011- 2687762 - 077 - 8441812.
ඊමේල් : premalalnsilva@gmail.com

03 - 487

---

**නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියයි

මාළඹේ සුමුදු මාවතේ 10 වැනි පටුමගේ පිහිටි පර්චස් 9.65 ක් විශාලැති දෙමහල් නිවසක් සහිත අගනා දේපළක්.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහනගර සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 477 C දරන පොතුඅරාව ග්‍රාම නිලධාරී වසමේ උතුරු තලංගම පිහිටියා වූ "ගොඩපරගහලන්ද" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට (බලයලත් මිනින්දෝරු ජී. ටී. ඒ. දිසානායක විසින් 2006 ජුනි මස 23 වැනි දින සාදන ලද අංක 2830 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 2) බලයලත් මිනින්දෝරු

නලින් හේරත් විසින් 2015 ජනවාරි මස 31 වැනි දින සාදන ලද අංක 3392 දරන ඉඩම් කොටස සමග එහි පිහිටි පස, ගහකොළ, වැවිලි, ගොඩනැගිලි යනාදී සියලු දේ සමග,

